# ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රය

## අති විශෙෂ

**අංක 1796/9 - 2013 පෙබරවාරි මස 06 වැනි බදාදා - 2013.02.06**

(රජයේ බලයපිට ප්‍රසිද්ධ කරන ලදී)


# I වැනි කොටස: (I) වැනි ඡෙදය - සාමාන්‍ය

## රජයේ නිවේදන

**2008 අංක 14 දරන ක්‍රමෝපාය සංවර්ධන ව්‍යාපෘති පනත (සංශෝධිත)**

3 (2) වැනි උපවගන්තිය යටතේ වූ නිවේදනය

2008 අංක 14 දරන ක්‍රමෝපාය සංවර්ධන ව්‍යාපෘති පනතේ (සංශෝධිත) 3(2) වැනි උපවගන්තිය යටතේ, මා වෙත පැවරී ඇති බලතල ප්‍රකාරව, ආයෝජන ප්‍රවර්ධන අමාත්‍ය ලක්ෂ්මන් යාපා අබේවර්ධන වන මා විසින්, මෙම නිවේදනය මගින් :-

(1) සීමාසහිත ශ්‍රී ලංකා ගේට්වේ ඉන්ඩස්ට්‍රීස් (පුද්ගලික) සමාගම හා ශ්‍රී ලංකා ආයෝජන මණ්ඩලය අතර ව්‍යාපෘති ගිවිසුමකට වර්ෂ 2012ක් වූ ජුනි මස 13 වැනි දින ව්‍යාපෘති ගිවිසුමකට එළඹෙන ලද බවත්, මහා පරිමාණ බැර කර්මාන්ත මෙන්ම ශ්‍රී ලංකා ආයෝජන මණ්ඩලයේ අනුමැතිය සහිත වෙනත් ව්‍යාපෘති පිහිටුවීම සඳහා සාම්පූර් ප්‍රදේශයෙහි බැර කර්මාන්ත සඳහා විශේෂ කලාපයක් පිහිටුවා එය සංවර්ධනය කිරීම, ක්‍රියාත්මක කිරීම සහ කළමණාකරණය කිරීම සඳහා අනුමත කරනු ලබන මෙකී ව්‍යාපෘති ආයෝජනය සහ වෙනත් ඉලක්ක කරගනු ලබන ආයෝජකයන් විසින් මෙකී කලාපය තුළ ස්ථාපිත කරනු ලබන අයෝජනවලින් උපයා ගැනීමට බලාපොරොත්තු වන්නා වූ ඇමරිකානු ඩොලර් මිලියන හාර දහසක (ඇ.ඩො. මිලියන 4,000) ආයෝජනයක් සහිතව පිහිටුවනු ලබන ඉහත කලාප ව්‍යාපෘතිය, ඉහත කී පනතේ කාර්යය සඳහා ක්‍රමෝපාය සංවර්ධන ව්‍යාපෘතියක් ලෙස හඳුනාගනු ලබන අතර, එම ව්‍යාපෘතිය යටතේ, එකී කලාපය තුළ ආයෝජනය කිරීමට බලාපොරොත්තු වන ආයෝජකයන් සඳහා අවශ්‍යවන භෞතික සහ සමාජයීය යටිතල පහසුකම්, අධ්‍යාපන සහ සෞඛ්‍ය පහසුකම්, නවීන අංගෝපාංග සහිත විනෝදාත්මක පහසුකම් ගැඹුරු මුහුදේ ජැටියක් ඉදිකිරීම සහ පර්යන්ත පහසුකම් සංවර්ධනය කිරීම, ගල් අඟුරු ගබඩා කිරීම සඳහා අංගනයක් ඉදිකිරීම සහ එම පහසුකම්වලට අමතරව මෙම ව්‍යාපෘතිය මගින් මෙම කලාපය ඇතුළත අභ්‍යන්තර පාරවල්, අදාල විදුලිබල සැපයුම, ජල සැපයුම, මළ අපවහන සහ ජල ප්‍රතිවහන පද්ධතියක් ඉදිකිරීම මෙම ව්‍යාපෘතිය මගින් කරනු ලබයි. මෙවැනි ව්‍යාපෘතියක් ජාතික යහපත උදෙසා වන අතර එමගින් රටට ආර්ථික සහ සාමාජීය ප්‍රතිලාභ හිමි කරදෙන අතර රටේ භූදර්ශනය වෙනස් වීමට ද තුඩුදිය හැකි වේ ;

(2) ඉහත කී ව්‍යාපෘතිය, ක්‍රියාත්මක කරනු ලබන දිනය වර්ෂ 2012ක් වූ ජුනි මස 13 වැනි දින අදාල ව්‍යාපෘති සමාගම සහ ශ්‍රී ලංකා ආයෝජන මණ්ඩලය අතර ගිවිස ගන්නා ලද ව්‍යාපෘති ගිවිසුමේ සඳහන් දිනය බවට ප්‍රකාශ කරනු ලබන අතර ;

(3) ඉහත කී ව්‍යාපෘතියෙහි කාර්යය සඳහා, 2008 අංක 14 දරන ක්‍රමෝපාය සංවර්ධන ව්‍යාපෘති පනත (සංශෝධිත) ප්‍රකාරව, මෙම නිවේදනයේ උපලේඛනයේ දක්වා ඇති නිදහස් කිරීම් මෙම ව්‍යාපෘති සමාගමට අදාල වියයුතු බවට නිශ්චිතව දක්වනු ලබන අතර, මෙම නිවේදනයේ උපලේඛනයේ (ආ), (ඇ), (ඈ), (ඉ) සහ (ඊ) යන ඡේදයන්හි පමණක් විදහා දක්වන නිදහස් කිරීම් ව්‍යාපෘති සමාගම විසින් අනුමත කරනු ලබන කොන්ත්‍රාත්කරුවන් සහ උප කොන්ත්‍රාත්කරුවන් සඳහා අදාල වනු ඇත.

### උපලේඛනය

**(අ) 2006 අංක 10 දරන දේශීය ආදායම් පනත (සංශෝධිත)**

(i) වසර විසි පහක (25) කාලසීමාවක් සඳහා ව්‍යාපෘති සමාගමේ බදු ගෙවිය යුතු ලාභය දේශීය ආදායම් පනතේ ප්‍රතිපාදනවලින් නිදහස් වේ (බදු නිදහස් කාලය). එකී වසර විසිපහක (25) බදු නිදහස් කාල පරිච්ඡේදය තුළ සහ ඉන්මතු වසර එකකට (1) ලාභවලින් කොටස්කරුවන්හට බෙදා දෙනු ලබන ලාභාංශවලට ආදායම් බදු නිදහස ලැබේ;

(ii) එකී බදු නිදහස් කාලය ව්‍යාපෘති සමාගම ලාභ උපයන මුල් වසරේ ආරම්භයේ සිට හෝ වාණිජමය කටයුතු ආරම්භ කිරීමෙන් වසර දෙකකට (02) පසු, යන දෙකින් කලින් එළැඹෙන දින සිට ආරම්භ වේ ;

(iii) ප්‍රාග්ධන වියදම් සඳහා ලබා ගත් විදේශ ණය සඳහා ගෙවන පොලිය සහ ව්‍යාපෘතිය මගින් සේවයේ යොදවනු ලබන උපදේශකයින්ට ගෙවනු ලබන තාක්ෂණික ගාස්තු මත රඳවා ගැනීමේ බදු ගෙවීමෙන් සමාගම නිදහස් කරනු ලැබේ ;

(iv) ඉහත විදහා පෙන්වා දී තිබෙන බදු නිදහස් කාල සීමාව සහ සහනකාරී බදු කාල සීමාව ඉකුත්වීමෙන් පසුව දේශීය ආදායම් පනතේ විධිවිධාන අනුව එවිට බලපවත්වන සාමාන්‍ය බදු රාමුව ව්‍යාපෘති සමාගම කෙරෙහි අදාල වනු ඇත ;

(v) සේවකයින් 20 දෙනෙකුගේ උපරිමයකට යටත්ව සමාගමේ ප්‍රවාසික සේවකයන් සම්බන්ධයෙන් උපයන විට ගෙවිය යුතු බදු ගෙවීමෙන් නිදහස් වේ. මෙම බදු නිදහස ව්‍යාපෘතිය වාණිජමය කටයුතු ඇරඹීමේ දින සිට වසර පහක (5) කාලයක් සඳහා වලංගු වනු ඇත.

**(ආ) 2002 අංක 14 දරන එකතු කළ අගය මත බදු පනත (සංශෝධිත)**

(i) ගිවිසගත් දිනයේ සිට ව්‍යාපෘතිය ඉදිකිරීම් කාල පරිච්ඡේදය තුළ ව්‍යාපෘතියට අදාළ භාණ්ඩ ආනයනය කිරීම සහ ව්‍යාපෘතියට අදාළ දේශීය වශයෙන් මිළදී ගනු ලබන භාණ්ඩ සහ සේවාවන් මත එකතු කළ අගය මත බදු ගෙවීම නිදහස් කරනු ලැබේ. මෙම භාණ්ඩ සහ සේවාවන් මත එකතු කළ අගය මත බදු ගෙවීම නිදහස් කිරීම ව්‍යාපෘතියේ ඍජු සැපයුම්වලට පමණක් නොව ව්‍යාපෘති සමාගම විසින් අනුමත කොන්ත්‍රාත්කරුවන් වෙනුවෙන් සැපයුම් සලසන උප කොන්ත්‍රාත්කරුවන් විසින් සිදුකරන සැපයුම් සඳහා ද අදාල වේ ;

(ii) ව්‍යාපෘති සමාගම විසින් සේවාවන් මත ලබාගත් ආදායම ව්‍යාපෘති ගිවිසුමේ සඳහන් අදියර 1 යටතේ ඉදිකිරීම් කටයුතු අවසන් කළ පසු හෝ ව්‍යාපෘති ගිවිසුමේ සඳහන් බලාත්මක වන දිනයේ සිට අවුරුදු තුනක (3) කාලය යන දෙකින් කවර හෝ අඩු කාල පරිච්ඡේදය තුළ ශුන්‍ය අනුපාතිකයට ප්‍රමිත කරනු ලැබේ ;

(iii) ව්‍යාපෘති ගිවිසුමේ සඳහන් අදියර 1, 2, 3 යටතේ ඉදිකිරීම් කටයුතු අවසන් කිරීමෙන් පසුව හෝ ව්‍යාපෘති ගිවිසුමේ සඳහන් බලාත්මක දිනයේ සිට අවුරුදු හතක (7) කාලය යන දෙකින් කවර හෝ අඩු කාල පරිච්ඡේදය තුළ එකතු කළ අගය මත බදු පනතේ 7 වැනි කොටසේ උපවගන්ති (1) හි (ආ) හෝ (ඇ) ඡේදයන්වල විධිවිධාන යටතේ ලබා දුන් සේවාවන් ඇතුළත් වන විට එකතු කළ අගය මත බදු ගෙවීම ශුන්‍ය අනුපාතිකයට ප්‍රමිත කරනු ලැබේ. ශුන්‍ය අනුපාතිකයට ප්‍රමිත කරනු ලබන සේවාවන් හැර කිසියම් සෙසු සේවාවන් මත සාමාන්‍ය පරිදි එකතු කළ අගය මත බදු ගෙවීම අදාල වනු ඇත.

**(ඇ) 2011 අංක 18 දරන වරාය සහ ගුවන් තොටුපල සංවර්ධන අයකිරීම් පනත (සංශෝධිත)**

ව්‍යාපෘතියේ ඉදිකිරීම් කාලය තුළ එම ව්‍යාපෘතිය ක්‍රියාත්මක කිරීම සඳහා ආනයනය කරන සියලුම ද්‍රව්‍යයන් ඉහත පනත යටතේ ගෙවනු ලබන අය කිරීම්වලින් අවුරුදු හතක (7) කාලයක් සඳහා නිදහස් වේ.

**(ඈ) 2009 අංක 9 දරන ජාතිය ගොඩනැංවීමේ බදු පනත (සංශෝධිත)**

ව්‍යාපෘතිය ඉදිකිරීමේ කාලය වන එනම් ව්‍යාපෘති ගිවිසුමේ සඳහන් බලාත්මක දිනයෙහි සිට වසර හතක (7) කාලයක් සඳහා අදාල නොවනු ඇත.

**(ඉ) 2005 අංක 05 දරන මුදල් පනත**

ව්‍යාපෘතිය ඉදිකිරීමේ කාලය වන ව්‍යාපෘති ගිවිසුමේ සඳහන් බලාත්මක දිනයෙහි සිට අවුරුදු හතක (7) කාලය තුළ ඉදිකිරීම් කර්මාන්ත සහතික අරමුදල් අයකිරීම් සහ ගෙවීම් අදාල නොවනු ඇත.

**(ඊ) (235 වැනි අධිකාරය වූ) රේගු ආඥාපනත**

ව්‍යාපෘතියේ අවශ්‍යතාවයන්වලට අනන්‍ය වශයෙන් ව්‍යාපෘතිය ක්‍රියාත්මක කරන සමාගම නමින් හෝ කොන්ත්‍රාත්කරුවන් හෝ උපකොන්ත්‍රාත්කරුවන් ආනයනය කරනු ලබන සියලු ප්‍රාග්ධන භාණ්ඩ සහ ඉදිකිරීම් ද්‍රව්‍යයන් සම්බන්ධයෙන් ව්‍යාපෘති ගිවිසුමේ සඳහන් බලාත්මක දිනයෙහි සිට වසර හතක (7) කාලය තුළ රේගු බදු අයකිරීම්වලින් නිදහස් කිරීම් අදාල වේ.

ලක්ෂ්මන් යාපා අබේවර්ධන (පා. ම.),
ආයෝජන ප්‍රවර්ධන අමාත්‍ය.

2013 පෙබරවාරි මස 06 වැනි දින,
කොළඹ දී ය.

02-707

ශ්‍රී ලංකා රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුවේ මුද්‍රණය කරන ලදී.